සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

**පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

**II පත්‍රය**

**නැණ ලොවට පා නගන හපනුන්ට මග කියන**

# "අදිති"

**2**

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 57 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

බලගල වැව සොහොන් පිටියක් මෙනි. දිරා ගිය ගස් සොහොන් පිටියක ඉදි කළ ස්මාරක වැන්න. විශාල සමතලයක් වූ තැනිතලාව පුරාණ වැවට අයත් ව තිබෙන්නට ඇතැයි සිතේ. පසෙකින් පිහිටි යෝධ වැව් කණ්ඩිය කාලයාගේ අකෘතඥ බලවේගයක මහිමය කියාපායි. පළින් පළ වූ මඩවගුරු වල් මීව්වන්ගේ ක්ෂේම භූමි බවට පත් වී ඇත.

- **ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.**

(i) සොහොන් පිටියක් සේ පෙනුණේ කුමක් ද ? ......................................................

(ii) මඩ වගුරුවල ජීවත් වන්නේ කවරහු ද ? ...............................................................

(iii) දිරා ගිය ගස් උපමා කර ඇත්තේ කුමකට ද ? .......................................................................................

(iv) **''වල් මීව්වන් ''** යන්නෙහි සඳහන් විශේෂණ පදය කුමක් ද? .........................

(v) එක් පැත්තකින් යන අදහස දීමට මෙහි යොදා ඇති පදය කුමක්ද? .................................

(vi) කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචනය ලියන්න. .......................................

02. පහත දී ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ශ්‍රී ලංකා කණ්ඩායමට...................................... ( විශිෂ්ඨ / විශිෂ්ට) ජයක් ලැබුණි.

(ii) උසාවියක් අසල ...................................... (නළා / නලා) ශබ්ද කිරීම තහනම් ය.

(iii) සීගිරිය කාශ්‍යප රජුගේ ...................................... ( විශිෂ්ඨ / විශිෂ්ට ) නිර්මාණයකි.

(iv) ...................................... (ඇල / ඇළ) ඉවුරේ දිය හබරල පඳුරු වැඩී ඇත.

03. පහත සඳහන් එක් එක් වගන්තිය සඳහා ගැළපෙන පදය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

( යති / ගියහ /නිවස / පියා / ගනිමි / වේගයෙන් / සරුංගල් )

(i) බහු වචන අතීත කාල ක්‍රියා පදයකි. ................................................

(ii) ප්‍රාණවාචී ඒක වචන නාම පදයකි. ................................................

(iii) අප්‍රාණවාචී බහු වචන නාම පදයකි. ................................................

(iv) උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදයකි. ................................................ ( 1 x 14 )

04. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරාගෙන ඊට යටින් ඉරක් අදින්න.

(i) **"ගජ නාලය"** තේරවිල්ල විසඳූ විට ලැබෙන්නේ ...............( දිවුල් ගෙඩිය / බත් ඇටය ) යන්නය.

05. පහත වාක්‍ය ලියන බසට හරවා ලියන්න.

(i) ගෙවිලියෝ ගොයම් කපනවා ...................................................................................

(ii) කුරුල්ලෝ ඉගිලී ගියා ...................................................................................

06. පහත දැක්වෙන වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

(i) තරුවක් අහසේ බබළයි. ...................................................................................

(ii) ඔහු පාරේ ගමන් කරයි ...................................................................................

07. පහත දැක්වෙන රබන් පදයේ අඩු පදය ලියන්න.

(i) අපේ ගෙදර තුන් දෙන යි
උඩහ ගෙදර තුන් දෙන යි
පහළ ගෙදර තුන් දෙන යි
.........................................................

08. පහත සඳහන් ඉංග්‍රීසි වචනවල සිංහල තේරුම හිස්තැනෙහි ලියන්න.

(i) Tongue ………………….. (ii) Mosquito ……………………….


09. පහත වචන නිවැරදිව ගලපා අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.

(i) in / hand / my / is / What ...........................................................................

(ii) a / This / tree / is / banana .....................................................................

10. පහත රූපවලට අදාල ඉංග්‍රීසි වචන ඉංග්‍රිසි අකුරෙන් ම ලියන්න.

 ..........................................

 ..........................................

11. පහත සඳහන් වාක්‍යයේ අර්ථය ඉංග්‍රිසියට හරවා ඉංග්‍රිසි අකුරෙන් ම ලියන්න.

ඔයාගෙ වයස කීය ද? ...................................................................................

12. පහත සඳහන් දෙමළ වචනවල අර්ථය සිංහලෙන් ලියන්න.

(i) නණ්බන් .................................... (ii)අණ්ණාමාර් ..........................................

13. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

පේළියට හිටගන්න ........................................................................... ( 1 x 16 )

14. ‘‘ ගෙවතු වගාව මිනිස් ජීවිතයට මහඟු අත්වැලකි ” යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක්ම වචන පහකට වැඩිවිය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය.)

- ..............................................................................................................................

  ..............................................................................................................................
- ..............................................................................................................................

  ..............................................................................................................................
- ..............................................................................................................................

  .............................................................................................................................. ( 2 x 3 )

- **දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**

15. දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න. 10000 ..................................................................................


16. (i) දී ඇති රෝම සංඛ්‍යාවට පසුව එන සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ම ලියන්න.

xii ...............

(ii)දී ඇති රෝම සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ම ලියන්න.

................. vii

17. පහත රූපය සමමිතික ව බෙදෙන රේඛාවන් රූපය තුළ අඳින්න.



18. 6432 සංඛ්‍යාවෙහි 4 ඉලක්කම පිහිටි ස්ථානයේ ස්ථානීය අගය කීය ද? ...............................

19. දී ඇති සංඛ්‍යා අතරින් කුඩා ම සංඛ්‍යාවත් විශාල ම සංඛ්‍යාවත් අනුපිළිවෙලින් ලියන්න.

7980 , 5870 . 7890 , 5780 .................................... ........................................

20. පෙරවරු 2 . 30ට අනුරාධපුරෙන් පිටත් වූ දුම්රිය පෙරවරු 6 . 30ට කොළඹ කොටුව දුම්රිය ස්ථානයට ළඟා විය.

(i) දුම්රිය ගමනට ගත වූ කාලය සොයන්න. පැය ......................................................

(ii) ගමන අවසන් කළ වේලාව පැය විසිහතර ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ලියන්න.

......................................................

( 2 x 6 )

21. පෙට්ටියක තිබෙන මුළු රඹුටන් ගණන 1150 කි. එයින් 780 ක් ඉදී ඇත.

(i) පෙට්ටියේ ඇති අමු රඹුටන් ගණන කෙතෙක් ද? ........................................................

(ii) මුළු රඹුටන් ගණන සමානව පෙට්ටි 5 කට ඇසිරීමට අවශ්‍ය පෙට්ටි ගණන කෙතෙක් ද?


..................................................................................

22. යහළුවන් තිදෙනෙක් එක් අයෙකුගෙන් රුපියල් 50/= බැගින් මුදල් යොදවා එකක් රුපියල් 35 බැගින් වන ඇපල් ගෙඩි 4 ක් ගෙන ලෙඩෙකු බැලීමට ගියහ. ඉතිරි මුදල තිදෙනා සමානව බෙදා ගත්හ. එක් අයෙකුට ඉතිරි ඉතිරි ලෙස ලැබුණු මුදල සොයන්න.

රුපියල් ..............................................................................

23. ළමයෙක් පිට්ටනියක හරි මැද උතුරු දිශාවට හැරී සිට තම වම් අත පැත්තට වට කාලක් හැරී මීටර 10 ගමන් කර නතරවෙයි. ළමයා මුහුණු ලා සිටින දිශාව කුමක් ද? ..............................................................

24. නගර කීපයක් දැක්වෙන සටහනක් පහත දැක් වේ




කොළඹ සිට දඹුල්ලට දුර 170 km ද


කුරුණෑගල සිට පොළොන්නරුවට දුර 140 km ද

කුරුණෑගල සිට දඹුල්ලට දුර 80 km ද නම්

කොළඹ සිට පොළොන්නරුවට දුර කොපමණ ද?


.................................... km

25. පහත රූපයෙන් $\frac{1}{2}$ ක් අඳුරු කරන්න.



..............................

26. මෙම රූපයේ සැලැස්ම පැන්සලෙන් පාට කරන්න.




27. අගය සොයන්න. 36 හි $\frac{1}{4}$ = ..................................

28. අන්නාසි ගෙඩියක බර 1 kg 500 g වෙයි. එම බරෙන්ම යුක්ත අන්නාසි ගෙඩි 2 ක බර කොපමණ ද? ...................................................


29. බෝතලයක අල්ලන පැණි බීම ප්‍රමාණය 450 ml කි. එවැනි බෝතල් 3ක තිබෙන පැණි බීම ප්‍රමාණය කොතෙක් ද? .....................................

( 2 x 9 )

30. ප්‍රස්තාරයේ ඇක්වෙන්නේ පලතුරුවලට කැමති සිසුන්ගේ තොරතුරු ය.

(i) කෙසෙල්වලට කැමති සිසුන් ගණන 11 ක් නම් එය ප්‍රස්තාරයේ දක්වන්න.

(ii) මිදිවලට මෙන් දෙගුණයක් කැමති මොනවාට ද? .................................




( 1 x 2 )

- **එක් එක් ප්‍රශ්ණයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

31. රූපයෙන් දැක්වෙන්නේ සූර්ය නමස්කාර අභ්‍යාසයේ කීවෙනි අවස්ථාවද?



1. දෙවන අවස්ථාව
2. තුන්වන අවස්ථාව
3. හතරවන අවස්ථාව

32. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක පියවරවල් කීයක් තිබේද?

1. 3 කි. 2. 2 කි. 3. 5 කි.

33. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක අවසාන පියවර කුමක් ද?

1. ශාරීරික ලිහිල් බව 2. අධිෂ්ඨානය 3. උදානය

34. ආහාර ද්‍රව්‍ය අපතේ යා හැකි ක්‍රමයක් **නොවේ.**

1. කුණු වීම. 2. ප්‍රවාහනයේදී තැලීම.
3. වෙළඳපොලේ ඉල්ලුම වැඩි වීම.

35. ප්‍රෝටීන් අඩංගු ආහාරයක් නොවන්නේ,

1. මස්. 2. බිත්තර. 3. දෙල්.

36. අයඩීන් අඩු විම නිසා වැළදේ,

1. ගලගණ්ඩය. 2 සෙංගමාලය. 3 මැලේරියාව.

37. ශ්‍රී ලංකාවේ සිතියම්වල මහා මාර්ග දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය වන්නේ,

1. රතු 2. කළු 3. කහ

38. ශ්‍රී ලංකාවේ සිතියම්වල දුම්රිය මාර්ග දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය වන්නේ,

. කහ 2. නිල් 3. කළු

39. පොළොව මතට ජලය ලැබෙන ප්‍රධාන ක්‍රමය වන්නේ ,

1. උල්පත් මගින් 2. ගංගා මගින් . 3. වර්ෂාව මගින්

40. ශ්‍රි ලංකාව බෙදා ඇති පළාත් ගණන වන්නේ

1. 25 කි 2. 3 කි 3. 9 කි

41 සඳ සම්පූර්ණයෙන්ම නොපෙනී යන දිනයකි.

1. අව අටවක 2. පසළොස්වක 3. අමාවක

42. ජාතික කොඩිය ඔසවන විට අප ජාතික ගීය ගායනා කළ යුත්තේ,

1. කොඩිය ඔසවන විට 2. කොඩිය එසවීමට පෙර 3. කොඩිය එසවීමෙන් පසු

43. ද්‍රවිඩ ජන වර්ගයාගේ අනන්‍යතාව සහතික කරන ආහාරය වන්නේ

1. බත් 2. පාන් 3. තෝසෙ

44. සිංහල ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ

1. සාරිය 2. ඔසරිය 3. ගවුම

45. පැළෑටියකට හිරු එළිය නොලැබුණු විට ශාකපත්‍ර ගන්නා පැහැය වන්නේ,

1. කොළ 2. කහ 3. තැඹිලි

46. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය හා ජාතික කොඩියේ යන දෙකේ දැකිය හැකි සංකේත දෙකක් පිළිවෙළින් වන්නේ,

1. බෝපත් හතර, සිංහ රූපය 2. පලාපෙති මෝස්තරය, බෝපත් හතර
3. කොළපාට තීරුව, ඉර හා හඳ

47. ඇස හා කන මඟින් එකවර තොරතුරු ලබා දෙන මාධ්‍ය වන්නේ,

1. රූපවාහිනිය 2. ශබ්දවිකාශන 3. දුරකතනය

48. ශ්‍රී ලංකාවේ පළමුවෙන්ම කර වූ දාගැබ වන්නේ,

1. රුවන්වැලිසෑය 2. ථූපාරාමය 3. අභයගිරිය

49. ගෙවත්තක බෝග වගාකිරිමේදී භාවිත කරන උපකරණයක් වන්නේ,

1. උදැල්ල 2. කියත 3. පීර

50. හොඳින් මේරූ බීජයක් හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,

1. බීජ සැහැල්ලුවෙන් පොඩි කළ හැකි වීම.

2. බීජයේ වර්ණය තද පැහැයක් නොගැනීම.

3. ජල භාජනයකට දමන බීජ පතුලට බැසීම.

51. කොම්පෝස්ට් පොහොර සෑදීමට යොදාගත හැකි ද්‍රව්‍යයක් වන්නේ,

1. ටින් කැබලි 2. වීදුරු කැබලි 3. කොළ රොඩු

52. තවාන්වලින් පැළ ලබාගෙන පාත්තිවල සිටුවන බෝගයක් වන්නේ,

1. මිරිස් 2. වට්ටක්කා 3. බෝංචි

53. කෙළින්ම පාත්තිවල සිටුවන බෝගයක් වන්නේ,

1. ගෝවා 2. බීට්රූට් 3. බණ්ඩක්කා

54. දඬු කැබලි පාත්තිවල සිටුවා පැළ ලබාගන්නා බෝගයක් වන්නේ,

1. බතල 2. පතෝල 3. වැටකොළු

55. පාත්තිවල අල සිටුවා පැළ ලබා ගන්නා බෝගයක් වන්නේ,

1. අර්තාපල් 2. බතල 3. මඤ්ඤොක්කා

56. අපට සේවාවන් සපයා දෙන පෞද්ගලික ආයතනයකි.

1. තැපැල් කාර්යාලය 2.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

3.සෙලාන් බැංකුව

57. මගීන් මාරුවන ස්ථානයක **''මාර්ගය හරහා යාම ආරම්භ කරන්න''** ප්‍රකාශ වන සංඥාව කුමක් ද?


1. කහ වර්ණයේ බල්බය 2. "කොළ පැහැති මිනිසා සංඥාව"

3. "රතු පැහැති මිනිසා සංඥාව"

58. පෝෂ්‍යදායී ආහාරයක් ලෙස සැලකිය **නොහැක්කේ**,

1. කොළකැඳ. 2. මුං ඇට. 3 .පැණි බීම.

59. රූපයේ දැක්වෙන පුෂ්පය වන්නේ



1. ඉද්ද 2. පිච්ච 3. සූරියකාන්ත

60. මාංශ භක්ෂක පක්ෂීන්ගේ පාද,

1.ඉතා කෙටිය 2. තියුණු උල් නිය සහිතය 3.එකට බැඳී පවතී ඇත

( 1 x 30 )